**ඉපලෝගම ප්‍රාදේශීය සභාව - 2022**

**---------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මිලදී ගන්නා වර්ෂයේ වත්කම් ක්ෂය නොකිරීමත් මිලදීගත් දිනය නොසලකා ඉවත් කරන වර්ෂයටම ක්ෂය කිරීම සභාවේ ප්‍රතිපත්තිය වුවත් 2022 වර්ෂයේදී මිලදී ගත් රු.118,728 ක කාර්යාල උපකරණ සඳහා රු.14,841 ක් ක්ෂය කර තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ මුළු ක්ෂය රු.24,364,832 ක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සඳහන් කර තිබුණු නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.24,549,636 ක් ලෙස රු.184,805 ක් වැඩියෙන් සඳහන් කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | 2021 වර්ෂයේ මිලදීගත් රු.1,909,230 ක ගොඩනැගිල්ලක් සඳහා 2022 වර්ෂයට අදාළ ක්ෂය රු.47,731 ක් වුවත් එය රු.86,154 ක් ලෙස රු.38,423 ක් වැඩියෙන් ගණනය කර තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඈ) | විදුලි භාණ්ඩ සහ උපාංග තොගයට ඇතුළත් බෝල්ට් ඇණ (බ්‍රැකට්) එකක් රු.220 බැගින් 139 ක් මිලදී ගෙන තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් තොගයේ අගය රු.35,445 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සභා බල ප්‍රදේශයේ පිහිටි දුරකථන කුළුණු වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.42,000 ක් ගිණුම් ගතකර නොතිබුණි. | -එම- | සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ලී බඩු එකතු කිරීම් රු.263,355 ක් වුවත් උපලේඛනය අනුව එය රු.313,355 ක් වුයෙන් රු.50,000 ක වෙනසක් විය. | පිළිගන්නා බව. | උපලේඛන සමඟ අනුරූපී වාර්තා සැසඳිය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් අනුව ලැබිය යුතු කසළ බදු ආදායම රු.3,113,600 ක් වු නමුත් උපලේඛනය අනුව එය රු.3,224,700 ක් වූයෙන් රු.111,100 ක වෙනසක් විය. | -එම- | -එම- |

**1.6.3 අධිකාරී බලය නොලත් ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොරෝනා වසංගතය හේතුවෙන් අයකරගත නොහැකි ශේෂ කපා හැරීම යටතේ හිඟ ව්‍යාපාර බදු ආදායම් රු.86,600 ක් පමණක් කපාහැරීමට සභා තීරණයක් මගින් අනුමත කර තිබුණු නමුත් රු.110,800 ක් කපාහැර තිබීම නිසා හිඟ ව්‍යාපාර බදු ආදායම රු.24,200 කින් අඩුවී තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළයුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) | 134 වගන්තිය | ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන ප්‍රකාශයට පත්කර නොතිබුණි. | ගැසට් කිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවට යවා ඇති බව. | වරිපනම් අයකර ගැනීම් සඳහා වූ කාර්යයන් කඩිනම් කළ යුතුය. |
| (ii) | 159(2) වගන්තිය | රු.3,224,700 ක හිඟ කසළ බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව. | හිඟ මුදල් අයකර ගැනීම කඩිනම් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු.6,900,567 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.14,729 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,962,400 | 4,183,035 | 3,200,395 | 3,525,900 | 2,899,150 | 3,233,290 | 2,197,080 | 2,543,260 |
| (ii) | කුලී | 9,010,586 | 8,877,828 | 9,211,969 | 1,960,085 | 7,182,083 | 8,480,904 | 7,898,174 | 2,294,226 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 416,350 | 451,550 | 385,050 | 229,500 | 452,100 | 337,450 | 345,000 | 163,000 |
| (iv) | වෙනත් ආදායම් | 17,154,000 | 18,435,126 | 17,602,484 | 20,131,132 | 14,781,000 | 13,205,375 | 17,466,364 | 19,298,490 |
| | | 29,543,336 | 31,947,539 | 30,399,898 | 25,846,617 | 25,314,333 | 25,257,019 | 27,906,618 | 24,298,976 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | 2022 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු.3,221,250 ක් විය. | රණජයපුර ප්‍රදේශයේ පදිංචිය අත්හැරයාම නිවාස සඳහා වැරදි ලෙස බිල් කිරීම හේතුවෙන් කසළ බදු හිඟය වැඩි වී ඇති බව. | විධිමත් අනුමැතිය ලබාගෙන නිවැරදි කසළ බදු ආදායම හඳුනාගත යුතුය. |
| (ආ) | **කුලී** | | |
| | සභාවට අයත් බදුදිය හැකි දේපළ 06 ක් සඳහා පළමු අවස්ථාවේදී ලංසු ඉදිරිපත්වී නොතිබුණු නමුත් අවම ලංසුව අඩුකර නැවත ටෙන්ඩර් කිරීමට කටයුතු කර නොතිබීම නිසා 2022 වර්ෂයේදී සභාවට රු.161,618 ක ආදායමක් අහිමිවී තිබුණි. | පිළිගන්නා බව. | සභාවට අලාභයන් නොවන පරිදි ක්‍රියාකළ යුතුය. |
| (ඇ) | **වෙනත් ආදායම්** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දැන්වීම් පුවරු ආදායම රු.163,000 ක් වු අතර ඒ තුළ වර්ෂ 04 කට පෙර සිට පැවත එන රු.67,800 ක් ද විය. | පිළිගන්නා බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දුරකථන කුළුණු ආදායම රු.42,000 ක් වු අතර ඒ තුළ වසර 04 කට පෙර සිට ලැබිය යුතු රු.24,000 ක් ද විය. | -එම- | -එම- |
| (ඈ) | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබු උසාවි දඩ රු.8,969,257 ක් හා මුද්දර ගාස්තු රු.8,149,500 ක් ලැබී නොතිබුණි. | හිඟ මුදල් කොටසක් අයකරගෙන ඇති බව. | ඉතිරි හිඟ මුදලද ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ සිට පැවත එන රු.49,433 ක් කර්මාන්ත ණයගැති (ප්‍රාග්ධන) ශේෂයක්ද 2017 හා 2018 වර්ෂවල සිට පැවත එන රු.252,948 ක කර්මාන්ත ණය හිමි ශේෂ 09 ක්ද, පැවතුණු නමුත් ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරන බව. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

3.2 **වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 18 දින අනතුරට පත් වී තිබුණු සභාවට අයත් ටිපර් රථය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් 2022 වර්ෂයේදී රු.306,500 ක් ගෙවා තිබුණු නමුත් අංක 2182/39 දරන ගැසට් නිවේදනයේ සඳහන් රීති 14 ප්‍රකාරව එම අලාභයට වගකිව යුතු පුද්ගලයන් හඳුනාගෙන අදාළ කටයුතු කර නොතිබුණි. | විනය නියෝග ලැබුණු පසු අයකර ගැනීමට කටයුතු කරන බව. | විනය නියෝග කඩිනමින් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය. |